# සොයුරියගේ ගිනි



**පසුගිය** සතියේ දවස් දෙක තුනක් විතර දවසේ උෂ්නත්වය තදින් තිබුනා ඔබට දැනෙන්න ඇති. කාලගුණික තත්ත්වය 24 ක් වගේ උණාට 40 ක් වගේ ඇඟට දැනුනේ. උවමනාවකට මෙල්බන් ගොසින් එනවිට දුටුවා ගිනි නිවන රථ පෙලක්ම වේගයෙන් යනවා. එක දවසක් හරියට පෑව්වොත් මේ රටේ ගිනි නිසා කොපමණ අනතුරු සිදුවෙනවාද? මේ ගිනි නිවන හමුදාවේ සේවය කරන මිනිසුන්ගේ සේවය කොපමණ උදාර කැපවීම් සහිත සේවා-වක්ද? ඇත්තටම අපේ රටේ නම් මේ සේ-වාව කෙතරම් සනීපදායක රැකියාවක්ද? ඒත් දැන්නම් ඒක ටිකක් වෙනස් වෙලා මේ ත්‍රස්තවාදී ප්‍රශ්නය නිසා. ගින්න කියන්නේ මිනිසාට හොඳ මෙන්ම නරකද එක හා සමානව ලබාදෙන ස්වාභාව ධර්මයාගේ දායාදයක් නේ. ලංකාවේ අපිට නම් ඕනම ගින්නක් හොඳට හුරුයි. බඩගින්නෙන් පටන් ගත්තම පෙම් ගිනි, ලසෝ ගිනි, වියෝ ගිනි, ලැව් ගිනි ආදී වශයෙන් කොපමණක්ද? ඊට අමතරව ඉතිං ඉදලා හිටලා ඇතිවන ආපදා ගිනිත් අපට හුරුයි නේ. ඒත් ඔබ අහල තියෙනවාද ටෙලිෆොන් ගිනි ගැන. නමින් නම් ඔබට ටිකක් හුරු ඇති. අපිට මේ ගින්න ගැන හිතෙන්නේ බොහොම සාමාන්‍ය දෙයක් විදිහටනේ.

මීට දශකයකට පමණ පෙර අප ඕස්ට්‍රේලියාවට සංක්‍රමනය වුනමුල් අවධියේදී ටෙලිෆෝන් ඇමතුම් නිසා බො-හොම ප්‍රශ්න ඇති උනා ඔබට මතක ඇතිද මන්දා. ඒ දවස් වල රැකියාවල් නැතුව ගෙවල් වලට වෙලා හිටපු අපේ ගෑනු සහෝදරියෝ බොහොම දෙනෙක් කලේ ගෙදර ටෙලිෆෝනයෙන් හතර වටේට කතා කරපු එකනේ. ඒවා ආගිය තොරතුරු වලින් පටන් ගෙන එකි-නෙකාගේ ඕපාදූප කතන්දර වලින් හැඩ වැඩ වෙලා කෙලවර වුනේ බොහෝ විට සිත් රිදීම් වලින්නේ. මුල් කාලේ සිදුවුන ඒ දේවල් වලට ඇත්තටම හුඟ දෙනෙකුට සමාවක් තියෙන බවයි මට නම් හැඟෙන්නේ. මොකද බොහෝ දේවල් සිදුවුනේ නොදැනුවත්කම, නුපුරුදුකම හා තනිකම වගේ දේවල් නිසා. සමහර දේවල් ප්‍රමාණය ඉක්මවා යාම නිසා තමයි ප්‍රශ්න ඇති උනේ.

ලංකාවේදී ටෙලිෆෝන් එකක් තිබුනේ කීයෙන් කීදෙනාටද. දැන්නම් හැම ගෙදරම තියෙන බව ඇත්ත. ඒ දවස්වල ටෙලිෆෝනය කියන් නේ වටිනා වස්තුවක් ඔබට මතක ඇති 70 දශකයේදී විතර රාජකාරී කාර්යාලයේ ටෙලිෆෝන් එකේ ඩයල් කරන රවුම් වලල්ලට සී සී මහත්තයා පොඩි ඉබ්බෙක් දාලා ලොක් කරනවා. ඇමතුමක් ගන්න කොච්චර දුෂ්කරද? එහෙම හිටපු අපේ අය හැමෝටම එක ගානේ ලැබුනම කතා කිරීමේ සීමාවක් තබා ගන්න අමාරු තමයි. අර වඳුරා කඩුව ගත්ත වගේ තමයි.

ඒත් ඉතිං පසුකාලයේදී සේරම යථා තත්ත්වයට පත්වුණාත් මේ ටෙලිෆෝනයෙන්ම රටම ගිනි තියන මිනිස-"සු තවමත් ඉන්න එක නම් කනගාටුදායක තත්ත්වයක්.

පසුගිය දිනෙක එවැනි ගින්නකට හසුවූ කෙනෙකුගේ කතාවක් දැන ගන්නට ලැබුනා. ඒක නම් සැබෑම ගින්නක්. අපි හැමෝම මේක ගැන බොහොම සරල ලෙස සිතුවත් සමහර විට එයින් ඇවිලෙන ගින්න ජීවිතය පුරාවටම තියෙනවා. ඒ ඇවිලෙන ගින්න නිවන්න ගිනි නිවන හමුදාවට තබා හර්කියුලිස් යානාවලටවත් බැහැ.

මේ කතාවේ නායිකාව දැන් අපේ හිතවතියක්. ඇය මීට කලකට පෙර බො-හොම සාර්ථක පවුල් ජීවිතයක් ගතකලා. සැමියත් දරු දෙදෙනාත් සමඟ තමන්ගේ නිවසක ඔවුන් ගතකල මේ සුන්දර ජීවිතය ඉවසා ග්න බැරි වුන කෙනෙකුත් හිටියා. අපේ සමහර අයට ඇති රෝගයක් තමයි ඕක. කිසිම හේතුවක් නොමැතිව අන් අයට ඊර්ෂ්‍යා කිරීම, අකුල් හෙලීම, එයින් තමන්ට ලැබෙන දෙයක් නැති උනත් ඉන් ලබන්නේ කුරිරු තෘප්තියක්. පර පීඩන තෘප්තිය කියන්නෙත් ඕකටම තමයි.

ඉතිං මේ පුද්ගලයා කලේ අර පවුලේ සැමියා ගැන බිරිඳට නිර්නාමික ඇමතුම් දීමයි. සැමියට අනියම් සම්බන්ධයක් ඇති බව පවසමින් දිගට ඇමතුම් ලබාදී තිබෙනවා. මුලදී විහිළුවක් සේ සැලකුවත් දිගින් දිගටම එන ඇමතුම් නිසත් බිරිඳ තුළ යම් සැකයක් ඇති උනා. සැමියාගේ ගමන් බිමන් ගැනත්, ඒ හා සම්බන්ධව කියූ කථාත් නිසා පවුලේ ප්‍රශ්න ඇතිවෙන්න පටන් ගත්තා.

පවුලේ හිතවතුන් කොපමණ උත්සාහ කළත් සැමියාගේ නිර්දෝෂී බව ඔප්පු කරන්නට එය සාර්ථක උනේ නැහැ. ඒක ගෑනු අපිට ඇති එක්තරා දුර්වල කමක්. බහින් බස් වීමෙන් ඇරඹුන දේ අඩ දබර, ගුටි බැට හරහා පවුල සීසී කඩ යන තත්ත්වයක් උදාවුණා.

තත්ත්වය කොතරම් දරුණු උනාද කිව-හොත් බිරිඳගෙන් පලි ගැනීමට සැමියා ඇත්තටම වෙනත් සම්බන්ධයක් පටන් ගත්තා. ඊට පසු වෙන දේ ඔබට සිතා ගත හැකි නේද? අවසානය උනේ අර බිරිඳත් දරු දෙදෙනාත් අනාථ වීම පමණයි. ඊට පසු අර ඇමතුම් ද නැවතුනා. සිදුවූයේ කුමක්ද යන්න හෙළිවෙන විට සියල්ල සිදුවී හමාරයි.

මේ ලෝකේ හැම හොඳ දෙයකම නරකක්ද තියෙනවා. ඒත් ඇයි මේ මිනිසුන් බොහෙ-්විට නරකම තෝරා ගන්නේ. මිනිස් සිත නම් මහා ප්‍රහේළිකාවක්.

මේ කථාව අහන්න, ජයේලගේ යාළුවෙක් හිටියා ඔහු කාර්මිකයෙක්. රැකියාවට අමතරව ගෙදර ගරාජයේ වැඩ කරනවා. අමතර ආදායමක් ලැබෙන නිසා ගෙදර වැඩ සඳහා ඔහු සේවය කරන සේවා ස්ථානයේ උපකරණද ඔහු යොදා ගන්නවා. ඒක හරි වැඩක් නුවුනත් සමහර අය ඒක කරනවනේ. දිනක් මේ යාළුවගේ හිතවතෙක් තමන්ගේ වාහනයේ වැඩක් සඳහා නිවසට පැමිණියා. යාළුවා වැඩේ කරන කම් ඔහු ගරාජයේ ඇවිදිමින් කථා කරමින් ආගිය තොරතුරු ආදායම් ගැන කතා කරමින් හිද වැඩේ කරගෙන ගියා.

ඊට පසු දින අප මිත්‍රයා රැකියාවට ගිය විට ප්‍රධානියාගෙන් කැඳවීමක් ලැබුනා.

ඔබ අපේ ආයතනයට අයිති බඩු ගෙදර ගෙනගොස් ගෙදරදී වෙනත් වාහන අලුත්වැඩියා කරන බව දැනගන්න ලැබුනා.. එය ඇත්ත ද? ප්‍රධානියා විමසුවා.

ඇත්තටම වෙන අයකුගේ නම් රැකියාවත් එයින්ම අවසන්. නමුත් මිතුරාගේ දිගු සේවා කාලයත්, ඔහුගේ හැකියා-වනුත් දන්නා ප්‍රධානියාගේ කාරුණික භාවය නිසා රැකියාව ආරක්‍ෂා උනා.

ඒ සමගම ප්‍රධානියා ඔහුට ලැබුන දුරකතන ඇමතුම ගැනද මිතුරාට පවසා තිබුණා. සිදුවී ඇත්තේ කුමක්ද යන්න මිතුරාට රහසක් උනේ නැහැ.

***<u>ඒත් ඉතිං පසුකාලයේදී සේරම යථා තත්ත්වයට පත්වුණාත් මේ ටෙලිෆෝනයෙන්ම රටම ගිනි තියන මිනිස්සු තවමත් ඉන්න එක නම් කනගාටුදායක තත්ත්වයක්.</u>***

මිනිසුන් මෙවැනි දෑ තුළින් ලබා ගන්නේ කුමක්ද? කුමන තෘප්තියක්ද? මෙවැනි දෑ අප අවට බොහෝ සිදුවනවා ඇති. මේවා සරල සිල්ලර දේ ලෙස සලකා ඉවතට දමන්නට අපට හැකිද?

මේ ටෙලිෆොන් ගින්න නම් නිවා දැමිය යුතු නිවා දැමිය හැකි ගින්නක් වේවා. මතුවන්නේ අතරින් පතර ලැව් ගිනි මෙන් වුවත් ඉන් වෙන ප්‍රතිඵලය නම් භයානකයි. සියළුදෙනාගෙන්ම ඉල්ලා සිටින්නේ ඇලෙක්සැන්ඩර් ග්‍රහැම් බෙල්ට අවමන් නොකරන ලෙසටයි.

- ධරණී -

---

## ජයග්‍රහණය

මහාබලගතු රටක් ,
යුදවදියි
පොඩිරටට.
තම බලය වපුරන්න.
තව රටක යුද්දයකි
ආගමට ගැරහුවට !
සුදු රටක්යුදකරයි
කලු හමට ගරහන්න
තව රටක යුද වදියි
ජාතියක් බේරන්න.
දෙ ඇස් ඇති මිනිසුනේ
බලනු මැන වට පිටම.....!
උපදින්න ණයට ගත්
මියෙන විට දමායන
මේ කුලී කය පවා
අහිමි අප........
යුද වැදී
කුමක් ජය ලබන්නද?

**අසෝකා දේවසුරේන්ද්‍ර**
ප්‍රංශය.

---




### චිත්ත වග්ගය

### මාර බැඳුමෙන් මිදිය යුතුය

සැවැත් නුවර දෙව්රම් වෙහෙරේ දී

දූරඞගමං ඒකචරං
අසරීරං ගුහාසයං
යේ චිත්තං සඤ්ඤමෙස්සන්ති
මොක්කන්ති මාරබන්ධනා

බොහෝ දුර දිවෙන ගමන් ඇති,
තනිව හැසිරෙන, සිරුරක් නැති,
ගුහාවක් තුළ ඇති ඒ සිත,
මුදා ගත්තේ ද, හේ, මාර බැඳුමෙන් මිදෙත්.

Durangamam ekacaram
asariram guhasayam
Ye cittam  sannmessanti
mokkanti marabandhana

Faring far wondering alone,
bodiless, lying in a cave is the mind.
Those who subdue it
are freed from the bond of Mara.

### නිධානය

භාගිනෙය්‍ය සංඝරක්කිත තෙර ඇරැඹ.

සැවැත් නුවර සංඝරක්කිත නම් රහතුන් වහන්සේ ගේ ගිහිකල නැගණිය විවාහයෙන් පසු පුත් කුමරෙක් ලැබ සොයුරු හිමියන්ට ගරු කිරීම් වශයෙන් ඒ රහතුන් වහන්සේගේම නම තැබූ හ. ඒ ළදරු කුමරු ළමා වියට පත් කළ සංඝරක්කිත රහතන් වහන්සේ වෙතට පමුණුවා පැවිදි කළ හ. ඒ කුඩා සාමණේර තෙම භාගිනෙය්‍ය සංඝරක්කිත යැයි ප්‍රසිද්ධ විය. ඒ කුඩා තෙරණුවෝ අසල ගමකට වස් වැසීම පිණිස ව"ය හ. සැදැහැවත් වු ඒ ගම වැසියෝ සිව් පසයෙන් උවැටන් කොට වස් කෙළවර වස් පිරිකර සඳහා සත්රියන් වතක් සහ අට රියන් වතක්ද ලෙසින් පිළිදෙකක් පිළිගැන්වූ හ.

වස් අවසානයේ දී ගුරු හිමියන් වැඩ සිටින වෙහෙරට වැඩම කළ හ. අට රියන් පිළියෙන් ගුරු හිමියන් පිදී ය. ගුරු හිමියෝ ඉතාම සුළු දෙයින් යැපීම් වශයෙන් තුටු වන්නේ ය. එනිසා අට රියන් පිළිය නොපිළිගෙන ගෝල හිමියන්ටම පැවරූ වේ ය. දෙවන වරත් තෙවන වරත් එසේම සිදුවිය. නොසන්සුන් වු සාමණේර හිමියෝ කලකිරුණෝ ය. මෙසේ සිතීය. "මුන් වහන්සේ ගිහිකල මගේ මාමාය. පැවිදි කල ගුරුවරයාය. එහෙත් දැන් මා සමග සබඳකම් අත්හරිති. මා මෙහි සිටිම ගැන කැමැත්තක් නැත. මා පිළිගැන්වූ පිළිය නොපිළිගන්නේ ඒ නිසයි. දැන් මෙහි විසීමෙන් පලක් නැත. යළි ගිහි වෙමියි, ගුරු හිමියන්ට තල් පතකින් පවන් සලමින්ම සිතී"ය. ඒතැන් සිට ගිහි ගෙයි දිවිගෙවන අයුරු සිහි කරන්නට විය.

"එළු දෙන්නු වහා පැටවුන් ගසති. අට රියන් වත විකුණා එළු දෙනක් ගනිමි. ඈ පැටව් ගැසු පසු පැටවුන් හදා විකුණා ධනය ලබන්නෙමි. ධනවත් වූ පසු බිරිඳක් සරණ කර ගනිමි. දරුවන් ලද පසු බිරිඳ හා දරුවන් සමඟ රියක නැඟ ගුරු හිමියන් බැහැදැක වැඳීමට යන්නෙමි. ඒ යන මග දරුවෙක් රියෙන් බිමට වැටුණොත් හෙම ඒ බිරිඳගේ නොසැලකිල්ල කියා කෙවිටෙන් බිරිඳට තලමියි" සිතමින් ගුරු හිමියන්ට පවන් සලමින් සිටින තල් අත්තෙහි මිටෙන් හිසට පහරක් ගැසුවේ ය. ගුරු හිමියන් තම ගෝල හිමිගේ සිතිවිලි බලා සංඝරක්කිතයෙනි, බිරිඳට පහර නොදිය හැකි හෙයින් අපට පහර දුන්නේ දැයි ඇසූ හ. ලැජ්ජව නිසා ගෝල හිමියන් ඉවතට පැන දිව්වේ ය. පසුව ඒ සාමණේර හිමියෝ බුදු හිමියන් හමුවට පැමිණවූහ. "බොහෝ දුර යන සුළු සිත හික්මවා රැක ගත්තහු මර බැම්මෙන් මිදෙන බව පෙන්වා බුදුරජාණන් වහන්සේ දහම් දෙසා බොහෝ දෙනට නිවන් අවබෝධ කළ සේක